## ***සේ.අ.අ. ප්‍රතිලාභ අයදුම් පත්‍රය (K අයදුම්පත්‍රය) සම්පූර්ණ කිරීම ..........***

01. ඔබ සේ.අ.අ. ප්‍රතිලාභ අයදුම් කිරීමේදී සේවය කළ සියලුම ආයතන වල සේවය අවසන් කර සිටිය යුතු අතර, අවසානයට සේවයෙන් ඉවත් වූ ආයතනයෙන් K අයදුම්පත්‍රය සම්පූර්ණ කර ගත යුතුය.

- ***<u>ඔබ සේවය කළ අවසාන සේවා ආයතනය සක්‍රීයව පවතී නම්................</u>***

**<u>K අයදුම්පත්‍රය</u>**

සාමාජික නමෙහි සිට සාමාජික අත්සන දක්වා කොටස් අයදුම්කරු විසින් සම්පූර්ණ කළ යුතුය.

නම් සහතික කොටස, ඇඟිලි සලකුණු, 11වන කොටස, ඞී ඇමුණුම ආයතනය විසින් සම්පූර්ණ කර අත්සන සහ නිලමුද්‍රාව තැබීම අනිවාර්ය වේ.

- සාමාජික නමෙහි විෂමතාවයක් පවතී නම් K අයදුම්පත්‍රයේ නම් සහතික කොටස ආයතනය මඟින් සම්පූර්ණ කිරීම අනිවාර්ය වේ. (විශාල වෙනසක් පවතී නම් අදාළ අනන්‍යතාව සනාථ කරන ආයතන ලිපි අධිකාරී, ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු කර නිවැරදි කළ යුතු වේ.)

- 11 වන කොටස අවසාන සේවායෝජක විසින් සම්පූර්ණ කළ යුතුය. අදාළ ආයතන නම, පාලන අධිකාරිය, සාමාජික නම, අවසන්වරට අධිකාරී ශ්‍රී ලංකා මහ බැංකුවට දායක මුදල් යැවූ දිනය (මෙය සේවය අවසන් කළ දිනය හා සමාන විය යුතු අතර, විෂමතාවයක් පවතී නම් ඊට අදාළ ආයතන ලිපිය ද, ඇමිණිය යුතුය) ඇතුළත් කළ යුතුය.

- ආයතන අංකය, පාලන අධිකාරියේ අත්සන (බලයලත් නිලධාරී) නිලමුද්‍රාව, දුරකථන අංකය ඇතුළත් කළ යුතුය.

- මාස 06කට වරක් දායක මුදල් තොරතුරු යවන ආයතන සඳහා විශේෂිතයි. මේ කාලයේ (මාස 06) අතර මැද මාසයක සේවයෙන් ඉවත් වූයේ නම්, එකී මාස 01,02,03,04,05ට ඇතුළත් දායක මුදල් තොරතුරු සම්පූර්ණ කර ආයතන අංකය, සාමාජික අංකය, සේවායෝජක නම, සේවායෝජක අත්සන හා තනතුර නිලමුද්‍රාව, දිනය ඇතුළත් කර නිවැරදිව සම්පූර්ණ කළ යුතුය.

- ආයතනය සක්‍රිය විටදී ඔබ සේවය කල සියලු සේවා ස්ථානවලට අදාළව අනුක්‍රමිකව ලියාපදිංචි B පත්‍ර ඇමිණිය යුතු අතර, B පත්‍රයක් නොමැති නම් දෙපාර්තමේන්තුව මඟින් පරීක්ෂා කර ලියාපදිංචියක් නොමැති නම් නැවත ABH පත්‍ර මඟින් ලියාපදිංචිය සිදු කළ යුතුය.

- <u>*ඔබ සේවය කළ අවසාන සේවා ආයතනය වසා ඇති නම්.................*</u>

**<u>K අයදුම්පත්‍රය</u>**

සාමාජික නමෙහි සිට සාමාජික අත්සන දක්වා කොටස් අයදුම්කරු විසින් සම්පූර්ණ කළ යුතුය.

නම් සහතික කොටස සම්පූර්ණ නොකළ යුතු අතර, ඇඟිලි සලකුණු, ඔබගේ ස්ථිර පදිංචියට අදාළ ග්‍රාම නිලධාරී විසින් සහතික කළ යුතුය.

- අදාළ ආයතනය වැසූ බව II වන කොටස තුළ නිර්දේශ විය යුත්තේ දෙපාර්තමේන්තු නිර්දේශය මත පමණි.

- අදාළ නිර්දේශය අවසාන ආයතන පිහිටි ප්‍රදේශයට අයත් කම්කරු කාර්යාලය මඟින් නිර්දේශ කළ යුතු වේ.

- ආයතනය වසා ඇති විටක, අධිකාරී ශ්‍රී ලංකා මහ බැංකුවෙහි සාමාජික නමෙහි විෂමතාවයක් පවතී නම් හෝ B පත්‍රය ලියාපදිංචි වී නොමැති නම් හානිපූර්ණ ලිපිය සම්පූර්ණ කර ග්‍රාම නිලධාරී, ප්‍රාදේශීය ලේකම් සහතික කර ආයතනය අදාළ කම්කරු කාර්යාලය මඟින් වැසූ ආයතනයක් බව සනාථ කළ යුතු වේ.

- වසා ඇති ආයතනයක B පත්‍රය ලියාපදිංචි වී නොමැති අවස්ථාවකදී හෝ B පත්‍රයක් නොමැති අවස්ථාවකදී සේවය කළ බවට තහවුරු කරගැනීම සඳහා ඔබ සතුව තිබෙන යම් තොරතුරක් ඉදිරිපත් කිරීම ඔබගේ ප්‍රතිලාභ ගෙවීම් කටයුතු පහසු වේ.

- අවසාන ආයතනය වසා ඇති විටක හානිපූර්ණ ලිපියට අමතරව පුද්ගල විස්තර පත්‍රිකාව සම්පූර්ණ කර ග්‍රාම නිලධාරී, ප්‍රාදේශීය ලේකම් සහතික කර තිබිය යුතුය. (අදාළ අංකය අවසාන අංකය නොවේ නම් පුද්ගල විස්තර පත්‍රිකාව අවශ්‍ය නොවේ.)

- අදාළ අයදුම්කරු/ අයදුම්කාරිය දැනට ස්ථිර පදිංචිය පිටරටක නම් අදාළ හානිපූර්ණය, පුද්ගල විස්තර පත්‍රිකාව අදාළ රටෙහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය මඟින් සහතික කළ යුතුය.

02. විදේශ රටක සිට අයදුම්කරන්නේ නම් සෘජුව සේ.අ.අ.ගෙවීම් අංශය සමඟ සම්බන්ධ වී (0112368904, 0112368911) තොරතුරු ලබා ගත යුතුය.

03. ඔබගේ ප්‍රතිලාභ අයදුම් පත්‍රය, ඔබගේ ස්ථිර පදිංචියට අදාළ ප්‍රදේශයේ ඇති දිස්ත්‍රික්/ උප කම්කරු කාර්යාලයට පෞද්ගලිකව ම ගොස් භාර දීමට කටයුතු කරන්න. ඒ සියලු කාර්යාල මඟින් ප්‍රතිලාභ නිදහස් කිරීමේ පහසුකම් සලසා ඇත.

04. ස්ථිර පදිංචියට විදේශ ගත වන සාමාජිකයින්, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සාමාජිකයින් (56/A, 330/N) ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සාමාජිකයින් (31538/B, 3223/A, 9306/A) සහ ලංකා පිඟන් සංස්ථාවේ සාමාජිකයින් (90/A) යන අයගේ අයදුම් පත්‍ර නාරාහේන්පිට ප්‍රධාන කාර්යාලයට භාර දීමට කටයුතු කරන්න.

05. ඉහත 23 වන වගන්ති ප්‍රකාරව සේ.අ.අ. ප්‍රතිලාභ ලබා ගැනීමෙන් පසුව නැවත ප්‍රතිලාභ ලබා ගත හැක්කේ වසර 05ක කාල සීමාවකට පසුවය.

තවදුරටත් යම් අපැහැදිලිතාවයක් වේ නම්, සේ.අ.අ. ගෙවීම් ප්‍රධාන කාර්යාලය සමඟ සම්බන්ධ වීමට කාරුණික වන්න. මීට අමතරව ඔබ අයදුම් කරන හේතුවට අදාළ ඇමුණුම් කළ යුතු ලේඛන පිළිබඳ තොරතුරු ලබා ගැනිමට කම්කරු දෙපාර්තමේන්තු වෙබ් පිටුව වෙත පිවිසෙන්න. (www.labourdept.gov.lk)